**මාධ්‍ය නිවේදනය**

සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477421 +94 11 2346304
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

**ශ්‍රී ලංකා මහ බැංකුව**
**இலங்கை மத்திய வங்கி**
**CENTRAL BANK OF SRI LANKA**

| | |
|---|---|
| **නිකුත් කළේ** | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
| **දිනය** | 2026.07.15 |

# ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය - 2026 ජුනි

## 2026 ජුනි මාසයේ දී ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක මගින් නිෂ්පාදන සහ සේවා ක්‍රියාකාරකම්වල වර්ධනයක් පෙන්නුම් කරයි

**නිෂ්පාදන අංශයේ ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 2026 ජුනි මාසයේ දී 53.0ක අගයක් වාර්තා කළේය.** මැයි මාසයට සාපේක්ෂව නිෂ්පාදන ක්‍රියාකාරකම්වල අඩු වේගයකින් වුව ද සිදු වූ අඛණ්ඩ වර්ධනය මෙමගින් පෙන්නුම් කරයි.

පසුගිය මාසයට සාපේක්ෂව ලැබුණු නව ඇනවුම් ප්‍රමාණය බොහෝ දුරට නොවෙනස්ව පැවතීම හේතුවෙන් ජුනි මාසයේදී නව ඇනවුම් උප දර්ශකය කඩඉම් මට්ටමේ ම පැවතුණි. ප්‍රධාන වශයෙන් ආහාර හා පාන නිෂ්පාදන අංශයේ සිදුවූ වර්ධනය හේතුවෙන් නිෂ්පාදන උප දර්ශකය තවදුරටත් වර්ධනය විය. සේවා නියුක්ති උප දර්ශකය කඩඉම් මට්ටම ආසන්නයේ පැවති අතර, එමගින් පෙර මාසය හා සමාන බඳවා ගැනීමේ ප්‍රවණතාවන් පෙන්නුම් කරයි. කෙසේ වෙතත්, සමීක්ෂණයට ප්‍රතිචාර දැක්වූ බොහෝ දෙනෙකු විසින් දිගු කලක් තිස්සේ පවතින පුහුණු ශ්‍රමික හිඟය සහ ඉහළ යන සේවක පිරිවැය අවධාරණය කරන ලදී. තොග මිලදී ගැනුම් උප දර්ශකය ජුනි මාසයේ දී තවදුරටත් ඉහළ යෑම මගින් පවතින අවිනිශ්චිත සැපයුම් වාතාවරණය හමුවේ හැකි සැමවිටම තොග රැස්කර ගැනීමට ආයතන මගින් ගන්නා උත්සාහය පිළිබිඹු කරයි. මේ අතර, ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය ජුනි මාසයේ දී තවදුරටත් ඉහළ ගියේය.

**නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ සමීක්ෂණයේ සාරාංශය**


| විචල්‍යය | 2026 මැයි | 2026 ජුනි | +/- | දිශානතිය |
|---|---|---|---|---|
| **නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **56.6** | **53.0** | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| නව ඇණවුම් | 52.6 | 50.0 | - | ඉහළ යෑමක සිට කඩඉම් මට්ටමට පැමිණීමක් |
| නිෂ්පාදන | 54.6 | 52.0 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| සේවා නියුක්තිය | 59.7 | 50.5 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| තොග මිලදී ගැනුම් | 52.6 | 56.6 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | 66.3 | 61.6 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

මැද පෙරදිග කලාපයේ පවතින නොසන්සුන්තාව හා සම්බන්ධ අභියෝගාත්මක පරිසරය හේතුවෙන් යම් බලපෑමකට ලක් වුව ද, නිෂ්පාදන කටයුතු සම්බන්ධ ඉදිරි අපේක්ෂා තවදුරටත් ධනාත්මක මට්ටමක පවතියි.

**නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය**
**2026 ජුනි**
**53.0**

**නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

### ගෝලීය ප්‍රවණතා
### නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකවල සාරාංශයක්

| රට / කලාපය | දිශානතිය |
|---|---|
| ගෝලීය | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| ඉන්දියාව | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| චීනය | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| එක්සත් ජනපදය | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| එක්සත් රාජධානිය | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| යුරෝපා කලාපය | අඩු වේගයකින් ඉහළ යෑමක් |

*මූලාශ්‍රය: එස්&පී ග්ලෝබල් (S&P Global)[1] ආයතනය, 2026 ජූලි 15 වන දිනට (PMI Releases (spglobal.com))*

*[1] එස් &පී ග්ලෝබල් (S&P Global) ආර්ථිකයන් 40 කට අධික ප්‍රමාණයක් සඳහා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරනු ලබයි.*

**සේවා අංශයෙහි ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, පෙර මාසයට සාපේක්ෂව සේවා ක්‍රියාකාරකම්වල අඛණ්ඩ වර්ධනයක් පෙන්නුම් කරමින්, 2026 ජූනි මාසයේ දී දර්ශකාංක 58.5ක අගයක් වාර්තා කළේය.**

පුළුල් ආංශික වැඩිදියුණු වීම්වල සහාය ඇතිව, 2026 ජූනි මාසයේ දී සේවා අංශයේ ව්‍යාපාරික ක්‍රියාකාරකම් වර්ධනය විය. ප්‍රධාන වශයෙන් මූල්‍ය සහ වෘත්තීය සේවා උප අංශ මෙම වර්ධනය සඳහා හේතු වූ අතර, රක්ෂණ අංශයේ වාර්තා වූ සැලකිය යුතු වර්ධනය ද ඒ සඳහා දායක විය.

2026 ජූනි මාසයේ දී නව ව්‍යාපාර වර්ධනය වූ අතර, ඒ සඳහා ප්‍රධාන වශයෙන් මූල්‍ය සේවා අංශයේ වර්ධනය හේතු විය. රක්ෂණ, වෘත්තීය සේවා සහ අනෙකුත් පුද්ගලික සේවා අංශ ද මෙම වර්ධනයට හේතු විය.

ආයතන කිහිපයක් සිය ශ්‍රම බලකාය පුළුල් කිරීම හේතුවෙන් 2026 ජූනි මාසයේ දී සේවා නියුක්තිය ඉහළ ගියේය. මේ අතර, මැයි මාසයේ දී පහත වැටුන නිම කිරීමට නියමිත කාර්යයන් උප දර්ශකය, ජූනි මාසයේ දී කඩඉම් සීමාවට ළඟා වීමත් සමඟ නොවෙනස්ව පැවතුණි.

**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ සමීක්ෂණයේ සාරාංශය**

| විචල්‍යය | 2026 මැයි | 2026 ජූනි | +/- | දිශානතිය |
|---|---|---|---|---|
| **සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය (ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය)** | **56.9** | **58.5** | + | **වැඩි වේගයකින් ඉහළ යෑමක්** |
| **නව ව්‍යාපාර** | 58.0 | 62.5 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| **සේවා නියුක්තිය** | 49.4 | 54.0 | + | පහළ යෑමක සිට ඉහළ යෑමක් |
| **නිම කිරීමට නියමිත කාර්යයන්** | 48.1 | 50.0 | + | පහළ යෑමක සිට කඩඉම් මට්ටමට පැමිණීමක් |
| **අපේක්ෂිත ඉදිරි ව්‍යාපාර ක්‍රියාකාරකම්** | 64.7 | 72.7 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව


ඉදිරි කාර්තුව සඳහා ව්‍යාපාරික ක්‍රියාකාරකම් පිළිබඳ අපේක්ෂාවන් ධනාත්මක මට්ටමක පැවති අතර, අපේක්ෂිත ආර්ථික වැඩිදියුණු වීම සහ එළඹෙන මහනුවර ඇසළ පෙරහැර සමය හේතුවෙන් සංචාරකයින්ගේ පැමිණීම ඉහළ යනු ඇතැයි අපේක්ෂා කිරීම ඒ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. කෙසේ වෙතත්, පුළුල් ගෝලීය අවිනිශ්චිතතාවයන් තවදුරටත් මෙම ඉදිරි දැක්මට අවදානම් එල්ල කරයි.

**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය (ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය)**

**2026 ජූනි**

**58.5**

**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය (ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය)**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**ගෝලීය ප්‍රවණතා**

**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකවල සාරාංශයක්**

| රට/ කලාපය | දිශානතිය |
|---|---|
| **ගෝලීය** | **වැඩි වේගයකින් ඉහළ යෑමක්** |
| **ඉන්දියාව** | **අඩු වේගයකින් ඉහළ යෑමක්** |
| **චීනය** | **අඩු වේගයකින් ඉහළ යෑමක්** |
| **එක්සත් ජනපදය** | **වැඩි වේගයකින් ඉහළ යෑමක්** |
| **එක්සත් රාජධානිය** | **වැඩි වේගයකින් පහළ යෑමක්** |
| **යුරෝපා කලාපය** | **අඩු වේගයකින් පහළ යෑමක්** |

*මූලාශ්‍රය: එස්&පී ග්ලෝබල් (S&P Global)[1] ආයතනය, 2026 ජූලි 15 වන දිනට*

**තාක්ෂණික සටහන:**

**ක්‍රමවේදය**

ප්‍රශ්නාවලිය ඊළඟ මාසයේ පළමු භාගයේ දී සම්පූර්ණ කෙරේ. සෑම විචල්‍යයක් සඳහාම, පෙර මාසය හා සසඳන විට වැඩි වීමක්, අඩුවීමක් හෝ නොවෙනස්ව පැවතීමක් ද යන්න වාර්තා කිරීමට ප්‍රතිචාර දක්වන්නන්ගෙන් ඉල්ලා සිටින අතර, යම් වෙනසක් සඳහා හේතු දැක්වීමට ඉල්ලා සිටිනු ලැබේ. දර්ශක සම්පාදනය සහ අර්ථ නිරූපණය සඳහා එස්&පී ග්ලෝබල් (S&P Global) ආයතනයෙහි සමීක්ෂණ ක්‍රමවේදය අනුගමනය කරයි.

**නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය,** නිෂ්පාදන ක්‍රියාකාරකම්වල මූලික දර්ශකය ලෙස සැලකෙන අතර, නව ඇණවුම්, නිෂ්පාදන, සේවා නියුක්තිය, තොග මිලදී ගැනුම් සහ ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය යන උප-දර්ශකයන්ගේ භරිත සාමාන්‍යයකි.

පිළිගත් ජාත්‍යන්තර ක්‍රමවේදයන් අනුගමනය කරමින්, ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය සේවා ක්‍රියාකාරකම්වල මූලික දර්ශකය ලෙස ගැනෙන අතර, එය **සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** ලෙස හඳුන්වනු ලබයි. තවද, සේවා අංශයේ සේවා ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය, නිෂ්පාදන අංශයේ නිෂ්පාදන දර්ශකය සමඟ සැසඳිය හැකිය.

**දර්ශකය**

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 0 සිට 100 අතර අගයන් පරාසයක විහිදී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට සමාන නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී නොවෙනස්ව පැවතී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා වැඩි නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී වර්ධනයක් පෙන්නුම් කරයි.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා අඩු නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී සංකෝචනයට ලක්වී ඇති බව පෙන්නුම් කරයි.

**නියැදිය**

මෙම සමීක්ෂණයෙහි නියැදි රාමුව සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවෙන් ලබාගන්නා ලද බස්නාහිර පළාතෙහි ස්ථානගත වී ඇති විශාල සමාගම් මත පදනම් වී ඇත. දළ දේශීය නිෂ්පාදිතයට දක්වන ආංශික දායකත්වය පදනම් කර ගනිමින් නිෂ්පාදන සහ සේවා කටයුතු සඳහා මාසිකව ප්‍රතිචාර 100 බැගින් වූ ඉලක්කයක් පවත්වාගෙන යනු ඇත.

**විචල්‍යයන්ගේ අර්ථ නිරූපණයන්**

| | |
|---|---|
| සේවා නියුක්තිය | : සමාගම සඳහා සේවය ලබාදෙන සේවකයන් ගණන |
| ගැනුම් තොගය | : නිෂ්පාදනය සඳහා යොදාගැනීමේ අරමුණින් මිල දී ගෙන ගබඩාවෙහි තබා ඇති අමුද්‍රව්‍ය |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | : සැපයුම්කරුවෙකුට ඇණවුමක් ලබාදීමෙන් පසු එය කර්මාන්ත ශාලාවට ලැබීමට ගතවන කාලය |
| නිම කිරීමට නියමිත කාර්යයන් | : නිම කිරීමට නොහැකි වූ ඇණවුම් |

අනෙකුත් විචල්‍යයන් ඒවා නම් කිරීම සඳහා යොදා ඇති වචනාර්ථයෙන්ම පැහැදිලි වේ.